# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 213/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 06/02/2024<br>පැය 1055 |

**මාධ්‍ය නිවේදනය**

**01. ගසක් කඩා වැටී දරුවෙකු මියයාමක් - ඇත්ගාල පොලිස් වසම.**

2024.02.05 වන දින උදෑසන කාලයේ ඇත්ගාල පොලිස් වසමේ පිහිටි ජාත්‍යන්තර පාසලේ ප්‍රාථමික අංශයේ පෙර පාසලක ළමා උද්‍යානයේ ක්‍රීඩා කරමින් සිටි ළමුන් පිරිසක් මතට අසල ඉඩමක තිබූ ගසක් කඩා වැටීමෙන් දරුවන් දෙදෙනෙකු සහ දැරියක් තුවාල ලබා ගම්පොල රෝහලට ඇතුලත් කර ඇත. තුවාල ලැබූ එක් දරුවෙකු මියගොස් ඇති අතර, අනෙක් තුවාල ලැබූ දරුවා වැඩිදුර ප්‍රතිකාර සඳහා මහනුවර රෝහලට මාරු කර යවා ඇත. තුවාල ලැබූ දැරිය ප්‍රථිකාර ලබා ගැනීමෙන් පසු රෝහලෙන් පිටව ගොස් ඇත.

**මියගිය දරුවා වයස අවුරුදු 04 ක් වන ඉල්ලවතුර, ගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගම්පොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඇත්ගාල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. ගසක් කඩා වැටී දරුවෙකු මියයාමක් - නෝර්වුඩ් පොලිස් වසම.**

2024.02.03 වන දින නෝර්වුඩ් පොලිස් වසමේ නිව්ටන් වත්ත ප්‍රදේශයේ කපන ලද ගසක ඇත්තක් වැටී තුවාල ලැබූ ළමයෙකු නාවලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා මහනුවර රෝහලට ඇතුලත් කිරිමේදී මිය ගොස් ඇති බවට නෝර්වුඩ් පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මියගිය ළමයා වයස අවුරුදු 16 ක් වන නිව්ටන් වත්ත, දික්ඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිය ගිය ළමයා නිව්ටන් වත්ත මැදින් යමින් සිටියදී වත්ත ඉහළ ප්‍රදේශයේ පිරිසක් විසින් ගසක් කපමින් සිටි අතර කපන ලද ගස වෙනත් ගසකට ගැටීමෙන් එම ගසෙහි අත්තක් ගමන් කරමින් සිටි ළමයාගේ වැදීමෙන් මෙම අනතුරට ලක්වී ඇත.

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර ඥාතීන්ට භාරදී ඇත. මෙම ගස කපන ලද නෝර්වුඩ්, දික්ඔය, අරනායක හා ගිනිගත්හේන ප්‍රදේශවල පදිංචි සැකකරුවන් 05 දෙනෙකු නෝර්වුඩ් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන 2024.02.05 වන දින හැටන්

ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.02.12 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. නෝර්වුඩ් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන් පැන ගිය රඳවියන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීම - වැලිකන්ද පොලිස් ස්ථානය.

2024.02.04 වන දින වැලිකන්ද පොලිස් වසමේ පිහිටි කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ඇතිවූ කලහකාරී සිදුවීමක් හේතුවෙන් රඳවියන් පිරිසක් කඳවුරෙන් පැන ගොස් ඇත. මේ සම්බන්ධව විමර්ශන සිදුකර රඳවියන් 14 දෙනෙකු වැලිකන්ද පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන ඇත. මෙම රඳවියන් 2024.02.05 වන දින පොළොන්නරුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.02.19 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.
පුලස්තිපුර පොලිස් ස්ථානය මගින් මෙම රඳවියන් 20 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔවුන් 2024.02.05 වන දින පොළොන්නරුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.02.16 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

වැලිකන්ද සහ පුලස්තිපුර පොලිස් ස්ථාන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. වගා ලිදකට වැටී දියේ ගිලී මිය යාමක් සම්බන්ධව - වාකරේ පොලිස් ස්ථානය.

2024.02.05 වන දින උදෑසන කාලයේ වාකරේ පොලිස් වසමේ තොම්පූර් පාර කදිරවේලි ලිපිනයේ පදිංචි පුද්ගලයකු වගා ලිදකට වැටී මිය ගොස් ඇති බවට වාකරේ පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ වාකරේ ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකි.**

මරණකරු වගාව සඳහා කෘමිනාශක ඉසීමට අවශ්‍ය ජලය ලබා ගැනීමට යාමේදී එම වගා බිමේ ඇති වගා ලිදකට වැටී ඇති බවට නිරීක්ෂණය වී ඇත. වාකරේ පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. සිවිල් වැසියන් පිරිසක් බඹර ප්‍රහාරයකට ලක්වීම සම්බන්ධව- ලිදුල පොලිස් ස්ථානය.

2024.02.05 වන දින උදෑසන කාලයේ ලිදුල පොලිස් වසමේ පිහිටි බඹරකැලේ වත්තේ තේ කර්මාන්තශාල කොටසේ සහ වලහ වත්ත ප්‍රදේශ වල බඹර කූඩ ඇවිස්සීම හේතුවෙන් කාන්තාවන් 06 දෙනෙකු හා පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු බඹර ප්‍රහාරයට ලක්ව ලිදුල රෝහලට ඇතුලත් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**